(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 30.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2009 සැප්තැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0198/'09

1.

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 අයවැයෙන් යුද වියදම් සඳහා වෙන්කර තිබෙන මුදල කොපමණද;

(ii) එම මුදල් සොයා ගැනීමට අපේක්ෂා කරන ප්‍රධාන මූලාශ්‍ර කවරේද;

(iii) ජාතිය ගොඩනැගීමේ බද්ද තුළින් උපයා ගැනීමට අපේක්ෂා කරන මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0255/'09

2.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "අපි වෙනුවෙන් අපි" අරමුදල ආරම්භයේ සිට මේ දක්වා එම අරමුදල සඳහා රජයෙන් ලබා දී ඇති මුදල කොපමණද;

(ii) එම අරමුදල ආරම්භ කළ දින සිට පුද්ගලයන්, ආයතන හා සංවිධානවලින් ලබාදී ඇති මුදල කොපමණද;

(iii) "අපි වෙනුවෙන් අපි" අරමුදල සඳහා මුදල් යොදවන ලෙස ජනතාවගෙන් ඉල්ලීම් කිරීමට කරන ලද ප්‍රචාරක කටයුතු කවරේද;

(iv) එම ප්‍රචාරක කටයුතු සඳහා කරන ලද වියදම කොපමණද;

(v) එම ප්‍රචාරක කටයුතු කරන ලද ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අරමුදලින් මේ වන විට වැයකර ඇති මුදල කොපමණද;

(ii) එම අරමුදලින් ත්‍රිවිධ හමුදාවේ හෝ පොලීසියේ සේවයේ නියුතු අයට නිවාස සකස්කර තිබෙන්නේ කවර ස්ථානයේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එම නිවාසවලින් කොපමණ සංඛ්‍යාවක් මේ වනවිට ත්‍රිවිධ හමුදාවේ හෝ පොලීසියේ අයට ලබා දී තිබේද;

(ii) එම අරමුදලින් ගොඩනගන නිවාස ලබාදීමේ ක්‍රමවේදය සවිස්තරව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0494/'09

3.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සිංහල මාධ්‍යයෙන් සංස්කරණය කර ඇති ප්‍රකාශනයේ 65 වන පිටුවේ "සැමට සරසවි" වැඩ සටහන් යෝජනාවේ සඳහන් කර ඇති පරිදි, නව සරසවි පාඨමාලා ආරම්භ කිරීම යටතේ පසුගිය ජනාධිපතිවරණයෙන් පසුව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අලුතින් ආරම්භ කරන ලද පාඨමාලා සංඛ්‍යාව කොපමණද;

(ii) වෙන් වෙන් වශයෙන් ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සංනිවේදන තාක්ෂණය යොදාගනිමින් දුරස්ථ වැඩසටහන් ක්‍රම කොපමණ සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ආරම්භ කර තිබේද;

(ii) එම පාඨමාලා කවරේද;

(iii) එම පාඨමාලා ආරම්භ කරන ලද විශ්වවිද්‍යාල කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) කොළඹින් බැහැරව පිහිටා ඇති විශ්වවිද්‍යාල ආශ්‍රිත ප්‍රදේශ විශ්වවිද්‍යාල ගම්මාන ලෙස සංවර්ධනය කිරීමට කර ඇති යෝජනාවට අනුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය ආශ්‍රිත ප්‍රදේශයත් එලෙස විශ්වවිද්‍යාල ගම්මාන වශයෙන් සංවර්ධනය කිරීමේ වැඩ සටහන මේ වන විට ලබා ඇති ප්‍රගතිය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0522/'09

4.

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008/2009 ජාතික ගෙවතු වගා මහා තරගය සඳහා තෙල්දෙණිය අධ්‍යාපන කලාපයේ පාසල් කොපමණ සංඛ්‍යාවක් ඉල්ලුම්කර තිබුණේද;

(ii) එම පාසල් කවරේද;

(iii) එම කලාපයේ අදාළ තරගයෙන් ජයග්‍රහණය කළ පාසල් පිළිවෙළින් කවරේද;

(iv) මප/තෙල්/ශ්‍රී දේවානන්ද කණිෂ්ඨ විද්‍යාලය අදාළ තරගයට ඉල්ලුම් කළේද;

(v) එසේ නම්, එම පාසල විනිශ්චයට ලක් කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0526/'09

5.

ගරු චන්ද්‍රිම වීරක්කොඩි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1994 වර්ෂයේ සිට මේ දක්වා විදේශ අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ලබා විදේශගතව ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එලෙස විදේශගත වූ වෛද්‍යවරුන් අතුරින් නැවත මෙරටට පැමිණි සංඛ්‍යාව කොපමණද;

(ii) නැවත නොපැමිණි අයගේ නම්, ලිපිනයන් සහ ඔවුන් වාසය කරන රටවල් කවරේද;

(iii) එලෙස නැවත නොපැමිණි අය වෙනුවෙන් ශ්‍රී ලංකා රජය විසින් වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නැවත නොපැමිණි වෛද්‍යවරුන් ආපසු ගෙන්වා ගැනීම සඳහා රජය මගින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0530/'09

6.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රජයේ කාර්මික හා වෘත්තීය පුහුණු ආයතනවලින් සැලසුම් ශිල්පී පාඨමාලාව හදාරා සුදුසුකම් ලැබූ 35000 ක පමණ පිරිසක් දිවයින පුරා වෘත්තීන්හී යෙදී සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම වෘත්තිකයන් ගොඩනැගිලි නිර්මාණය සඳහා පිළිනොගන්නේ කවර හේතුවක් නිසාද;

(ii) මෙම සැලසුම් ශිල්පීන්හට තම වෘත්තිය නීත්‍යානුකූල කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0538/'09

7.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ බී. එම්. අශෝක ජයසිංහ මහතා විශ්‍රාම ගොස් ඇත්තේ කවදාද;

(ii) ඒ කොපමණ වයසක් සම්පූර්ණ වීමෙන්ද;

(iii) විශ්‍රාම ගැනීමෙන් පසු ඔහුට පළමු සේවා දිගුව ලබා දී ඇත්තේ කවදාද;

(iv) ඒ කවර නෛතික පදනමක් යටතේද;

(v) ඒ මහතාට දෙවන සේවා දිගුව ලබාදෙන්නේ කවදාද;

(vi) ඒ කවර නෛතික පදනමක් යටතේද;

(vii) ඒ කොපමණ කාලයක් සඳහාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා කවුරුන්ද;

(ii) එම නිලධාරියාට වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ධුරය ලබාදෙන්නේද;

(iii) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2007, 09/2007 (1) සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2008 උල්ලංඝනය කරමින් වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ධුරයේ මේ වනවිට රැඳී සිටින බී. එම්. අශෝක ජයසිංහ මහතා විසින් දෙනු ලබන නියෝග, උසස්වීම්, පත්වීම් සහ ඔහු විසින් ලබා ගන්නා ලද වැටුප් හා දීමනා නීත්‍යානුකූල වන්නේද;

(ii) නොඑසේ නම්, ඒ මහතා සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0547/'09

8.

ගරු සුජාතා අලහකෝන් මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ගුරු පුහුණු ආයතන ලෙස පිහිටුවන ලද විද්‍යාපීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත විද්‍යාපීඨ සඳහා 2009 වසර තුළ පමණක් බඳවාගත් ගුරු සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) විද්‍යාපීඨ ගුරු සිසුන් වෙනුවෙන් මාසිකව ගෙවනු ලබන දීමනාව කොපමණද;

(iii) ඒ අනුව 2009 දී බඳවා ගන්නා ලද විද්‍යාපීඨ ගුරු සිසුන් වෙනුවෙන් රජය විසින් වැය කළ මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2009 වර්ෂය තුළ පොළොන්නරුව, පුලතිසිපුර විද්‍යාපීඨයේ නේවාසිකව සිටින පළමු හා දෙවන වසර ගුරු සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් සඳහා මාසිකව රජය විසින් වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) විද්‍යාපීඨ ගුරු සිසුන් සඳහා ගෙවනු ලබන දීමනාව ප්‍රමාණවත් නොවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) (i) එසේනම් ඉහත දීමනාව වැඩිකිරීමට අදහස් කරන්නේද;

(ii) ඒ කොපමණ ප්‍රමාණයකින්ද;

(iii) එය ක්‍රියාත්මක වන්නේ කවදා සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0548/'09

9.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ, ඉඩම, පීරිස් මාවතේ, යූ. සී. ලැන්ඩ් (U. C. Land) නමින් තිබෙන පිඹුරු අංක 515 A දරන, හෙක්ටයාර් 0.64516 ක වපසරියකින් යුත් ඉඩම, 1988 වර්ෂයේදී එවකට මොරටුව නගර සභාව විසින් මැනීම් සිදුකර, ඉඩම් කොටස් 44 කට බෙදා වෙන්කර ඉඩම්ලාභීන්ට ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ඉඩම්වල නිරවුල් අයිතිය මෙතෙක් එම ඉඩම්ලාභීන්ට ලබා දී නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ඉහත ඉඩම්ලාභීන්ට නිරවුල් ඔප්පු ලබාදීමෙන් එම අය මුහුණ දෙන දුෂ්කරතාවලින් මුදවා ගැනීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0223/'09

10\.

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "මාතර සංවර්ධන අරමුදල" නමින් අරමුදලක් ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූයේද;

(ii) එසේනම් එය ආරම්භ කළේ කවදාද;

(iii) එම අරමුදල ක්‍රියාත්මක වූ කාල පරිච්ඡේදය තුළ ධීවර අමාත්‍යධුරය දරන ලද්දේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අරමුදලට අදාළ බැංකුව හා බැංකු ගිණුම් අංකය කවරේද;

(ii) එම අරමුදලට මුදල් ලැබුණු මූලාශ්‍රයන් කවරේද;

(iii) අරමුදල් ලෙස ලැබුණු ප්‍රමාණය කොපමණද;

(iv) එම අරමුදලේ මුදල් යොදවා තිබෙන්නේ කවර කටයුතු සඳහාද;

(v) ඒ කොපමණ මුදල් ප්‍රමාණයකද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0523/'09

11\.

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර - මහියංගනය මාර්ගය පුළුල් කිරීමේ කටයුතු ආරම්භ කළේ කවදාද;

(ii) එම මාර්ගයේ වැඩකටයුතු අවසන් කිරීමට ඇස්තමේන්තුකොට ඇත්තේ කෙදිනකද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) එම මාර්ගයේ දුර ප්‍රමාණය කිලෝමීටර් කොපමණද (සංවර්ධනය කරන කොටස);

(v) ඒ අනුව, එක් කිලෝමීටරයක් සඳහා කොපමණ මුදල් ප්‍රමාණයක් වැයවේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0527/'09

12\.

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2004 සිට 2009 දක්වා කාලසීමාව තුළ රාජකාරී වේලාවන්හිදී පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදී, රාජකාරිය පැහැර හැර ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වෛද්‍යවරුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එම වෛද්‍යවරුන් සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ගන්නා ලද විනය ක්‍රියාමාර්ග කවරේද;

(iii) එලෙස විනයානුකූල පියවර ගන්නා ලද වෛද්‍යවරුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0532/'09

13.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— කම්කරු සබඳතා හා මිනිස් බල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1980 ජූලි වැඩ වර්ජනයට සහභාගීවීම හේතුවෙන් රැකියා අහිමි වූ, පේෂකර්ම අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල සේවය කළ සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතුරින් නැවත රැකියා ලබාදී ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) නැවත රැකියා නොලැබුණු සංඛ්‍යාව කොපමණද;

(iv) මොවුන්ට රැකියාව නොලැබුණේ කවර හේතුවක් නිසාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 32/89 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය අනුව, සංස්ථා වර්ජකයින්ට අදාළ සහන සමහර අයට මෙතෙක් ලබා දී නැත්තේ කවර හේතුවක් නිසාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2006.08.30 දිනැති අමප/06/1540/230/039 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුමතිය ලැබී ඇතත්, කම්කරු කොමසාරිස් විසින් මෙම ගෙවීම් කටයුතු ප්‍රමාද කරන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0239/'09

14.

ගරු ජේමසිරි මානගේ මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ තිබෙන ප්‍රදීපාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට ක්‍රියාත්මක ප්‍රදීපාගාර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දෙවිනුවර පිහිටි ප්‍රදීපාගාරයෙන් 2005 ජනවාරි මස 01 වැනි දින වන විට ආලෝකය විහිදවනු ලැබූ දුර ප්‍රමාණය නාවික සැතපුම් කොපමණද;

(ii) එම ප්‍රදීපාගාරයෙන් 2009 ජනවාරි මස 01 වැනි දින වන විට ආලෝකය විහිදවනු ලබන දුර ප්‍රමාණය නාවික සැතපුම් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0524/'09

15.

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "අපි වවමු - රට නගමු" තේමාව යටතේ, 2007/2008 මහ කන්නය තුළ ක්‍රියාත්මක කරන ලද ජාතික ගෙවතු වගා මහා තරඟය කොපමණ ක්ෂේත්‍ර සංඛ්‍යාවක් යටතේ පැවැත්වූයේද;

(ii) එම ක්ෂේත්‍ර කවරේද;

(iii) ඒ ඒ ක්ෂේත්‍රවලින් ජයග්‍රණය කරන ලද අය කවුරුන්ද;

(iv) 2008/2009 වසර තුළ අදාළ තරඟය පැවැත්වූයේද;

(v) 2007/2008 වසරට සාපේක්ෂව 2008/2009 වසරේ ලබා ඇති ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2009.05.26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතු ය. අ. භා. 3.30 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

2.

ගරු ලලිත් දිසානායක මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය,—

" ශ්‍රී ලංකා ගණක ශිල්පී සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යතුමා,— සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත යටතේ නියෝගය,— 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනතේ 11 වැනි වගන්තිය යටතේ කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යතුමා විසින් සාදනු ලැබ, 2009 මැයි මස 19 දින, අංක 1602/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.08.26 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*4.

ප්‍රවාහන අමාත්‍යතුමා,— ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ නියෝගය,— 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 46 (ඌ) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 44 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යතුමා විසින් පනවන ලදුව 2009 මැයි මස 29 දිනැති අංක 1603/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.09.10 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*5.

ඉන්දියානු ආගාමික කම්කරු (ඉවත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*11.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජූනි 17) [1]

*12.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*14.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*15.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*16.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*17.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*18.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*20.

කැළෑ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*21.

පතල් හා ඛණිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*22.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*26.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥාපනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*27.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*28.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

29.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

30.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

31.

ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

32.

බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

33.

ග්‍රාමීය සේවක සහ අනුබද්ධිත ග්‍රාමීය සම්පත් සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

“ පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය” යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.